**සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදල - 2017**

---

සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2013 අංක 1 දරන දිවි නැගුම පනතේ 45 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්වාගණනය කළ මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 තත්වාගණනය කළ මතය

------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට **සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදලේ** මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රමිත අංක 1 හි ඡේද අංක 21 ප්‍රකාරව අරමුදලේ ස්කන්ධය/ ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ප්‍රමිත අංක 7 ප්‍රකාරව නිලාවේලි පුහුණු මධ්‍යස්ථානය සහිත අක්කර 7 පර්චස් 37 ක ඉඩම රු. 126,255,800 කට මිලදීගෙන තිබූ අතර, ඉඩම් හා ගොඩනැඟිලි ලෙස වෙන් වෙන්ව හඳුනාගෙන ගිණුම් ගත කර නොතිබූ අතර අසීමිත ජීවිත කාලයක් ඇති ඉඩම් සඳහා සමාලෝචිත වර්ෂයේ සිට සියයට 10 ක් ක්ෂය කිරීමට කටයුතු කර තිබුණි. එමෙන්ම වටිනාකම රු. 6,003,155 ක් වූ පොතුවිල් සංචාරක නිවාසයේ නිත්‍යානුකූල අයිතිය වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු බව ගිණුම්කරණ සටහන් මඟින් හෙළිදරව් කර නොතිබූ අතර ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ලෙස සටහන් කළයුතු වටිනාකම රු. 90,972 ක්වූ අයිතම් 18 ක් ස්ථාවර වත්කම් යටතේ කාර්යාල උපකරණ ලෙස දක්වා තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විශේෂ ව්‍යාපෘති 2 කට අදාළව දරන ලද වියදම් එකතුව රු. 3,330,004 ක් පරිපාලන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළව ගෙවිය යුතු එකතුව රු. 60,814,119 ක් වූ වියදම් ශීර්ෂ 8 ක් වෙනුවෙන් උපචිත වියදම් ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ලැබියයුතු ආයෝජන පොළියට අදාලව ගෙවිය යුතු රු. 27,255,491 ක් වූ රඳවාගැනීමේ බදු ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) 2016 සහ 2017 වර්ෂ වෙනුවෙන් විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.

#### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

-----------------------------------

ගිණුම් විෂයයන් 2 කට අදාළව එකතුව රු. 9,633,185 ක ගනුදෙනු සම්බන්ධයෙන් ශේෂ සනාථ කිරීම් ඉදිරිපත් නොවුණි.

**2.2.4 නොසැසඳෙන පාලන ගිණුම්**

-----------------------------------

ගිණුම සමඟ ඉදිරිපත් කර තිබූ පාලන ගිණුම පරීක්ෂා කිරීමේදී දිස්ත්‍රික්ක 7 ක අත්තිකාරම් පියවීම් හා මුදල් පොත අනුව අත්තිකාරම් පියවීම් අතර රු. 4,684,469 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**-------------------------------------**

සිප්දොර ආකෘති පත්‍ර මුද්‍රණය කිරිම සඳහා ආයතන දෙකකින් ලබාගත් ආපසු ගෙවනු ලබන තැන්පතු ශේෂ එකතුව රු. 38,050 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

**--------------------------------------------------------------------------**

2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකර වත්කම්වල නිවැරදිතාවය සනාථ කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**----------------------**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

**-----------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු. 778,303,990 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 1,121,745,567 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 343,441,577 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. මෙම පිරිහීමට අරමුදලේ ප්‍රතිලාභී ගෙවීම් රු. 410,034,200 කින් ඉහල යාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**---------------------------**

**4.1 කාර්යසාධනය**

------------------

**4.1.1** 1997 ජනවාරි 01 දින ප්‍රකාශයට පත්කරන ලද සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදලට අදාල භාර ඔප්පුව ප්‍රකාරව සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ සුභසාධනය හරහා සමාජ සංවර්ධනය ඇති කිරීමට අවශ්‍ය වියදම් හා පහසුකම් සැපයීමේ පරමාර්ථ හා අරමුණු ඇතිව මෙම අරමුදල පිහිටුවා තිබුණි. එසේ වුවද, අරමුදලේ පරමාර්ථ හා අරමුණු වලින් බැහැරව සමලෝචිත වර්ෂයේ අවස්ථා 10 කදී රු.5,382,976 ක් වැයකර තිබුණි.

**4.1.2** දුගී හා සමෘද්ධිලාභි පවුල්වලින් පේරාදෙණිය විශ්ව විද්‍යාලයට තේරීපත්වන දරුවන්ට ශිෂ්‍යත්ව ලබාදීම සඳහා "සර් අයිවෝ ජෙනින්ස් පදනම" යන පදනමක් සඳහා හිටපු ක්වේට් තානාපතිවරයෙකුගේ ඉල්ලීම මත විෂයභාර අමාත්‍යවරයාගේ ලිඛිත දැනුම්දිමට අනුව රු. මිලියනයක් ලබා දී තිබුණද එම පදනමේ නීත්‍යානුකූලභාවය, එම කාර්යය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අදාළ විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයාගේ දැනුවත්භාවය හා එකඟතාවය යනාදී කිසිදු කරුණක් පිළිබඳව අවධානය යොමු කර නොතිබුණි. මෙම අරමුදල විශ්ව විද්‍යාලය හරහා පිහිටුවනු ලැබූ අරමුදලක් නොවන බවත් මෙමඟින් කිසිදු මුදලක් විශ්ව විද්‍යාලය වෙත ලැබී නොමැති බවත් උපකුලපතිවරයා විසින් විගණකාධිපති වෙත කරුණු ඉදිරිපත් කර තිබුණි. මෙම පදනම නමින් 2017 මාර්තු 20 දින ලංකා බැංකුවේ ආරම්භ කර තිබූ ජංගම ගිණුමට මැයි 9 දින මුදල් බැරකර තිබූ අතර අගෝස්තු 8 දින භාරකරුවන් විසින් රු. 713,000 ක් ලබාගැනීමෙන් පසු එදිනට ගිණුමේ ඉතිරි ශේෂය රු. 287,000 ක් වීමෙන් අදාළ අරමුණට මුදල් යොදවා නොමැති බව නිරීක්ෂණය විය.

**4.1.3** සෞන්දර්ය විශ්ව විද්‍යාලයේ ඉල්ලීම අනුව ඉන්දියාවේ නවදිල්ලි නගරයේ පැවති භාරතීය රාජ්‍ය මහෝත්සවය නියෝජනය කිරීම සඳහා සෞන්දර්ය විශ්ව විද්‍යාලීය විද්‍යාර්තයින් 17 දෙනෙකු ඉන්දියාවට යැවීම සඳහා ගුවන්

ටිකට් පත් වෙනුවෙන් රු. 816,000 ක් මුදලක් ගෙවීමට භාරකාර මණ්ඩලය අනුමැතිය ලබාදී තිබූ අතර මෙම විද්‍යාර්ථීන් සමෘද්ධිලාභීන්ද යන්න සහ අදාළ කරුණු වෙනුවෙන් එම මුදල් වැයකළ බවට අරමුදල සතුව කිසිදු තහවුරු කිරීමක් නොතිබුණි.

**4.1.4** සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2017 වර්ෂයේ **සමෘද්ධි නිෂ්පාදන** ආදර්ශ **ගම්මාන** වැඩසටහන යටතේ රු. මිලියන 52.45 ක ප්‍රතිපාදන වෙන්කරගෙන තිබියදී භාරකාර අරමුදලේ අරමුණුවලට පටහැනිව ආදර්ශ ගම්මාන 50 ක් සඳහා භාරකාර අරමුදලින් රු. මිලියන 500 ක් ලබාදීමට භාරකාර මණ්ඩලය විසින් තීරණය කර සමාලෝචිත වර්ෂයේදී රු. 303,133,240 ක් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ලබාදී තිබුණි. මෙම වැඩසටහනට අදාළ ඇස්තමේන්තු හා සැලසුම් අරමුදලේ කළමනාකරන මණ්ඩලය වෙත ලබා දී නොතිබූ අතර ගම්මාන 50 හඳුනාගැනීමට අදාළ තොරතුරුද අරමුදල සතුව නොතිබුණි.

**4.1.5** සනීපාරක්ෂක වැසිකිලි පහසුකම් ලබාදීම සඳහා කටුවන ප්‍රදේශයේ සහ සේරුවාවිල නෙළුම්ගම යන ප්‍රදේශවල දිවිනැගුම ප්‍රතිලාභීන් 20 දෙනෙකුට එකතුව රු. 700,000 ක් ගෙවීමට භාරකාර මණ්ඩලය අනුමැතිය දී තිබුණු අතර පසුව සමාජ සවිබල ගැන්වීම හා සුභ සාධන නියෝජ්‍ය අමාත්‍යවරයාගේ ඉල්ලීම අනුව ප්‍රතිලාභීන් 100 දෙනෙකු සඳහා රු. 3,500,000 ක් ගෙවීම් කර තිබුණි. මෙහිදි සනීපාරක්ෂක සේවා ලබාදී ඇති ප්‍රතිලාභීන් සමෘද්ධිලාභීන්ද යන්න තහවුරු නොවූ අතර මෙම මුදල් අදාළ කාරණය සඳහා යොදවා ඇද්ද යන්න පිළිබඳව පසුවිපරම් කිරීමක් සිදුකර නොතිබුණි.

## 4.2 මානව සම්පත් කළමනාකරණය

සමාජ ආරක්ෂණ අරමුදලේ අධ්‍යක්ෂ තනතුර 2018 වර්ෂයේ සිටද සහ ගණකාධිකාරී තනතුර 2012 වර්ෂයේ සිට වර්තමානය දක්වා පුරප්පාඩුව පැවති අතර ස්ථිරව බඳවා ගැනීමට කටයුතු නොකර වැඩබැලීම සහ කොන්ත්‍රාත් පදනම මත නිලධාරින් පත්කර තිබුණි.

## 5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15 ඡේදයේ ඇතුළත් මුදල් රෙගුලාසි 877(2)(ඇ) ප්‍රකාරව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් තුළ මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට පිටපතක් සහිතව විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වසර 04 ක ප්‍රමාදයකින් පසුව 2021 දෙසැම්බර් 8 දින විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි.

## 5.2 අයවැය ලේඛනමය පාලනය

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.1 ඡේදය සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15 ඡේදයේ ඇතුළත් මුදල් රෙගුලාසි 877(1) රෙගුලාසිය ප්‍රකාරව අරමුදලේ කටයුතු සම්බන්ධයෙන් අයවැය ලේඛනයක් හා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලද අතර අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ස්ථාපිත කර ගිණුම් පොත්පත් හා වාර්තා ක්‍රමානුකූලව පවත්වා ගැනීම කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.